ගෝලීය ව්‍යාප්ත කොවිඩ්-19 වසංගතය මර්දනය කිරීමට සෞඛ්‍ය හා ආරක්ෂක අංශ කටයුතු කරමින් සිටිනා මොහොතක, ඊට සහයෝගය සහ දායකත්වය ලබාදීමත්, ඒ සඳහා පනවා ඇති රෙගුලාසි හා ක්‍රියාමාර්ගයන්ට අනුකූල වීමත් සෑම අංශයකම නියැළෙන්නෙකුගේම, සෑම පුරවැසියෙකුගේම වගකීමක් බව නොකිවමනායි. එසේම ඒ සම්බන්ධයෙන් සමාජය දැනුවත් කිරීමත්, නිවැරදි තොරතුරු ලබාදීමත්, පුද්ගල ගෞරවය ආරක්ෂා වන ආකාරයෙන් සහ ආචාර ධර්මානුකූල අයුරින් වාර්තා කටයුතු කිරීමත් මාධ්‍යයේ වගකීමයි.

මේ සම්බන්ධයෙන්, අද දෙරණ, හිරු නිව්ස් සහ ස්වාධීන රූපවාහිනී පුවත් විකාශයන් තුළ දක්නට ලැබුණු දර්ශන කිහිපයක් වෙත අපගේ අවධානය යොමු වුණි. එහිදී ඔවුන් ආරක්ෂක අංශ/සෞඛ්‍ය නිලධාරීන් විසින් පොදු ස්ථානයන්හි මුඛ ආවරණ පැළඳ නොමැති අයවලුන්ට තරයේ අවවාද කරනු පෙන්වයි. කෙසේ නමුත් එම දසුන් එම පුද්ගලයින්ගේ අනන්‍යතාවයන් හෙළි වන පරිදි, මුහුණු බොඳ කිරීමකින් හෝ වෙනත් එවැනි පියවරකින් තොරව එම දර්ශන ප්‍රවෘත්ති විකාශය ඔස්සේ ඉදිරිපත් කෙරේ.

මෙවන් මෙහෙයුම් සිදුවන බව පෙන්වා දීමත්, මෙම වසංගත කාල සමයේදී නිර්දේශ කොට ඇති සෞඛ්‍ය පුරුදු පිළිපැදීම අනිවාර්ය බව පෙන්වා දීමත් සැබැවින්ම යහපත් කරුණකි. කෙසේ නමුත් එම වගකීම ඉටු කරනා අතරවාරයේදී පුද්ගල ගරුත්වය ආරක්ෂා නොකිරීම අයහපත් නොවේද? උක්ත සඳහන් පණිවුඩය සමාජයට ලබාදීමේදී, එම පුද්ගලයින්ගේ අනන්‍යතාවය සඟවා, ඔවුන්ගේ පුද්ගල ගරුත්වය ආරක්ෂා කරමින් එම දර්ශන පෙන්වාදීම නොහැකි දෙයක් නොවේ. එයද මාධ්‍ය අත ඇති ආචාර ධාර්මික වගකීමේ කොටසක්ම නොවන්නේද?

**#COVID19 #Media #MoH_SriLanka #MediaEthicsSL #lka #TV #NewsPapers #Coronavirus #ITN #TVDerana #HiruTV**